සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

අනාවරණ පරීක්ෂණය | පැය 02 යි
கண்டுபிடிப்பு சோதனை | 02 மணி நேரம்
Diagnostic Test | 02 Hours

ජීවන නිපුණතා සහ පුරවැසි අධ්‍යාපනය 1 / 11 | 8ශ්‍රේණිය
வாழ்க்கைத் திறன்கள் மற்றும் குடியுரிமைக் கல்வி | தரம் 8
Life skills & Citizenship Education 1 / 11 | Grade87

සම්පූර්ණ නම - ..........................................................................................................

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්ණවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතරු තෝරා **යටින් ඉරක්** අඳින්න.

1. පොදු සේවා සපයන ආකාරය අනුව ඒවා බෙදා දක්වන කොටස් ගණන කීයද?

   1. 3 කි  11. 2 කි  111. 5 කි  1V. 4 කි.

2. අධ්‍යාපනය මගින් ඉටුවන කාර්යයන් නොවන්නේ මින් කුමක්ද?

   1. නව දැනුම ලබා දීම  11. වෛද්‍ය සායන පැවැත්වීම
   111. යහපත් පුරවැසියන් බිහිකිරීම  iv. ජාතික සමගිය පෝෂණය කිරීම

3. ළමා අයිතිවාසිකම් පිළිබඳ තේමා ගණන වන්නේ

   1. 2 කි  11. 8 කි  111. 4 කි  1V. 6 කි.

4. පාස්කු උත්සවය කිනම් ආගමකට අදාළ උත්සවයක්ද?

   1. බෞද්ධ ආගමට සම්බන්ධ උත්සවයකි  11. හින්දු ආගමට සම්බන්ධ උත්සවයකි
   111. ක්‍රිස්තියානි ආගමට සම්බන්ධ උත්සවයකි  1v. ඉස්ලාම් ආගමට සම්බන්ධ උත්සවයකි

5. පෘතුවි අභ්‍යන්තරයේ සිදුවන භෞතික ක්‍රියාවලියක් වන්නේ මින් කුමක්ද?

   1. ගංවතුර  11. භූමිකම්පා  111. අකුණු  1V. කුණාටු

- **අංක 06 - 10 දක්වා ඇති වගන්ති නිවැරදි නම් ( √ ) ලකුණද වැරදිනම් ( X ) ලකුණද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

6. ජන ජීවිතයේ එදිනෙදා කටයුතු පහසු කිරීම පොදු සේවාවල අවශ්‍යතාවයකි. (..................)

7. බැංකු සේවා බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භ කළ පොදු සේවාවකි. (..................)

8. අයහපත් චිත්තවේග සමනය සඳහා යොදාගත හැකි ක්‍රියාමාර්ගයකි ,මිතුරන් ඇසුරු කිරීම (..................)

9. බ්‍රිතාන්‍ය බහු සංස්කෘතික සමාජයක් පවතින රටකි. (..................)

10. භූ චලන මිනිස් ක්‍රියාකාරකම් නිසා පමණක් ඇතිවන විපතකි. (..................)

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා “අ” කොටසට අදාල පිළිතුර “ආ” කොටසින් තෝරා අදාල ඉංග්‍රිසි අක්ෂරය දී ඇති වරහන තුළ ලියන්න.**

| | අ | | | ආ |
|---|---|---|---|---|
| 11. | දිවයින තුළ ක්‍රියාත්මක වන වෛද්‍ය ක්‍රමයකි | (  ) | a. | ආගම |
| 12. | සංස්කෘතික අංගයකි | (  ) | b. | හෝමියෝපති |
| 13. | බහු සංස්කෘතික සමාජයක දැකිය හැකි ලක්ෂණයකි | (  ) | c. | ප්‍රශ්නවලට සවන් දීම හා හා ප්‍රශ්න විසඳීම |
| 14. | දූෂිත නායකත්ව ශෛලියේ ලක්ෂණයකි | (  ) | d. | එල්නිනෝ |
| 15. | කාලගුණික හා දේශගුණික විපර්යාස නිසා සිදුවන විපතකි | (  ) | e. | විවිධ ආගම් පැවතීම |
| | | | f. | පොදු දේපළ අයුතු ලෙස පරිහරණය කිරීම |

- **අංක 16 -20 දක්වා ප්‍රශ්න සඳහා ගැළපෙන පිළිතුර වරහන තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

16. එකා සැමටත් සැම එකාටත් යනු ......................... ආදර්ශ පාඨයයි.

17. ඉතා දැඩිව ක්‍රියාකිරීම ............................. ලක්ෂණයකි.

18. මෙහෙයවීමේ හැකියාව .................................... සතු විය යුතු ගුණාංගයකි.

19. ඉන්දියාවේ පවතින ආගමක් වන්නේ ...................................... ආගමයි.

20. ඇමරිකාවේ පවතින ආගමක් වන්නේ ...................................... ආගමයි.

( ශ්‍රී ලංකා පොලිසියේ , ඒකාධිපති නායකත්ව ශෛලියේ , නායකයෙකු , සමුපකාරයේ , ශිව,රෝමානු කතෝලික

## 11 වන කොටස

සැලකිය යුතු කරුණු

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

1). i. ඔබ ප්‍රයෝජනයට ගන්නා පොදු සේවා දෙකක් ලියන්න.

ii. පොදු සේවාවක් ලෙස ජලය සැපයීමට අවශ්‍ය හේතු දෙකක් ලියන්න.

iii. ලංකා විදුලි බල මණ්ඩලයේ ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලයක කාර්ය මණ්ඩලයේ දෙදෙනෙකු නම් කරන්න.

iv. පවුල තුළ දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ දෙකක් ලියන්න.

v. සමාජයට නායකයෙකු අවශ්‍ය වීමට හේතු දෙකක් ලියන්න.

vi. නාමික නායකත්ව ශෛලියේ ලක්ෂණ දෙකක් ලියන්න.

vii. බහු සංස්කෘතික ජන සමාජ පවතින රටවල් දෙකක් නම් කරන්න.

viii. ඉස්ලාම් ආගමික උත්සව දෙකක් නම් කරන්න.

ix. අකුණු වලින් සිදු විය හැකි හානි වලක්වා ගත හැකි ක්‍රම දෙකක් ලියන්න.

x. අනතුරු හා ආපදාවලදී සහාය ලබාගත හැකි ආයතන දෙකක් ලියන්න.

( 2 x 10ලකුණු 20 )

2). i. මගී ප්‍රවාහනය සඳහා සේවා සපයන ආයතන දෙකක් නම් කරන්න. (ලකුණු 2 )

ii. පොදු ප්‍රවාහන සේවය කාර්යක්ෂම කිරීම සඳහා රජය ගනු ලබන ක්‍රියාමාර්ග තුනක් ලියන්න. (ලකුණු 3 )

iii. ප්‍රවාහන සේවා ප්‍රයෝජනයට ගන්නා පුරවැසියන්ගෙන් ඉටු විය යුතු යුතුකම් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5 )

3). i. සෞඛ්‍ය සේවය මගින් ඉටුවන කාර්යයන් දෙකක් ලියන්න. (ලකුණු 2 )

ii. දිවයින තුළ ක්‍රියාත්මකවන වෛද්‍ය ක්‍රම තුනක් ලියන්න. (ලකුණු 3 )

iii. බටහිර වෛද්‍ය ක්‍රමය යටතේ රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා පිහිටා ඇති රෝහල් පහක් නම් කරන්න. (ලකුණු 5 )

4. i. පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 2 )

ii. ප්‍රජාතන්ත්‍රවාදී ජීවනක්‍රමයක් හුරු කිරීමට පාසල තුල ක්‍රියාත්මක වන විෂය සමගාමී ක්‍රියාකාරකම් තුනක් ලියන්න. (ලකුණු 3 )

iii. පවුලේ සියලු දෙනා එක්ව සාකච්ඡා කර සිදු කරනු ලබන විශේෂ කටයුතු පහක් ලියන්න. (ලකුණු 5 )

5. i. සමාජය තුළ දැකිය හැකි නායකත්ව ශෛලීන් දෙකක් ලියන්න. (ලකුණු 2 )

ii. ප්‍රජාතන්ත්‍රවාදී නායකයෙකු සතු විය යුතු ගුණාංග තුනක් ලියන්න. (ලකුණු 3 )

iii. ප්‍රජාතන්ත්‍රවාදී දිවි පැවැත්ම සමාජ යහපතට හේතු වන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5 )

6. i. බහු සංස්කෘතික ජන සමාජයක් යනු කුමක්ද? (ලකුණු 2 )

ii. බහු සංස්කෘතිය හා බැඳුණු උත්සව තුනක් නම් කරන් (ලකුණු 3 )

iii. ඉන්දියාව තුළ පවතින ජනවර්ග දෙකක් හා භාෂා තුනක් ලියන්න. ( ලකුණු 5 )

7. i. රියදුරන් අතින් සිදුවන වැරදි දෙකක් ලියන්න. (ලකුණු 2 )

ii. පදිකයන් අතින් සිදුවන වැරදි තුනක් ලියන්න. (ලකුණු 3 )

iii. මාර්ග අනතුරක් සිදු වූ අවස්ථාවකදී ක්‍රියා කළ යුතු ආකාරය කෙටියෙන් විස්තර කරන්න ( ලකුණු 5 )

## පිළිතුරු - 8 ශ්‍රේණිය - පුරවැසි අධ්‍යාපනය

1 කොටස

(1). I (2). II (3). III (4). III (5). II

(6). √ (7). √ (8). √ (9). √ (10). x

(11). b (12). a (13). e (14). f (15). d

(16). සමූපකාරයේ (17). ඒකාධිපති නායකත් ශෛලියේ (18). නායකයෙකු

(19). ශිව ( 20). රෝමානු කතෝලික

2 කොටස

(1). i ප්‍රවාහනය , අධ්‍යාපනය , සෞඛ්‍යය , විදුලිය , ජලය , ආරක්ෂක සේවා , තැපැල් සේවා , සමූපකාරය , පණිවිඩ හුවමාරුව , පරිසර සංරක්ෂණය

ii.

- දිවයිනේ සෑම ප්‍රදේශයකම අවශ්‍යතා සපුරාලීමට තරම් ජල සම්පත සුලභ නොවීම.
- භූගත ජලය හා ගංගා ජලය විවිධ හේතු නිසා අපවිත්‍ර වීම.
- නගරබද ප්‍රදේශවල ජන සංඛ්‍යාව අධික වීම.
- වියලි කාල වලදී විවිධ ප්‍රදේශ ජල හිඟයකට මුහුණ පෑම.

iii. ප්‍රා දේශීය විදුලි ඉංජිනේරු , සහකාර විදුලි ඉංජිනේරු , විදුලි අධිකාරි , ලිපිකරු කාර්ය මණ්ඩලය , මනු කියවන්නන් , රියදුරන් , විදුලි ශිල්පීන්

iv. *ආදරය හා රැකවරණය නොඅඩුව ලැබීම * අන් මත ඉවසීම හා සවන් දීම *සාකච්ඡා මගින් තීරණවලට එළඹීම්
* දෙමාපිය නායකත්වයට ගරු කිරීම * සමානාත්මතාවයෙන් කටයුතු කිරීම
*සාමූහිකව නිවසේ කටයුතුවලට හවුල් වීම

v. *නිවැරදි දර්ශනයක් සහිතව සංවිධානය , ආයතනය , රාජ්‍යය ගොඩනැගීම
* ඉලක්ක නිර්මාණය කිරීම හා ඉලක්ක කරා මෙහෙයවීම
* නියමිත පරිදි සැලසුම් කිරීමට
* අභියෝග විරෝධතා භාරගැනීමට
* අනුගාමිකයන් උනන්දු කරවීමට *ගැටළු විසඳා දීමට හා අවම කිරීමට
* අභියෝග විරෝධතා ප්‍රජාතන්ත්‍රීයව පාලනය කිරීම * අනුගාමිකයන් ඇඳ බැඳ තබාගැනීමට

vi. *ජනතා සුබසිද්ධියට කටයුතු නොකිරීම
*පැහැදිලි අරමුණු ඉලක්ක නොතිබීම

*තමා කැපී පෙනීමට උත්සාහ දැරීම

*වෙනස්කම් සිදු නොකිරීම

*යහපත් නායකත්ව ගුණාංගවලින් තොරවීම

vii. *ශ්‍රී ලංකාව , ඉන්දියාව , බ්‍රිතාන්‍යය , ඇමෙරිකා එක්සත් ජනපදය

viii. *මිලාදුන් නබි උත්සවය , රාමසාන් උත්සවය , හජ්ජි උත්සවය

ix. *එළිමහන් ස්ථානවල රැඳී සිටීමෙන් වැළකීම *හුදෙකලා ස්ථාන හෝ උස් ගස් යට හෝ රැඳී නොසිටීම *දුරකතන භාවිතයෙන් වැළකීම *ලෝහ භාණ්ඩ ස්පර්ශ කිරීමෙන් වැළකීම *විදුලි උපකරණ භාවිතයෙන් වැළකීම *විදුලි උපකරණ ජේනුවලින් ගලවා දැමීම

x. රෝහල , පොලිසිය , ත්‍රිවිධ හමුදාව පළාත් පාලන ආයතන , ගිනි නිවන ඒකකය , රතුකුරුස සංවිධානය , කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව , ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

(2). i. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව , ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය , පෞද්ගලික බස් සේවා , ගුවන් සේවා

ii. මාර්ග නඩත්තුව හා අලුත්වැඩියා කටයුතු සිදුකිරීම , අධිවේගී මාර්ග ඉදිකිරීම , නව බස් රථ ධාවනයට එක් කිරීම , මගී ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නීතිමය පියවර ගැනීම, පෞද්ගලික බස් රථ සේවා දියුණු කිරීම සඳහා දිරිගැන්වීම් ලබා දීම.

iii. ප්‍රවාහන සැපයුමට අදාළ දේපල ආරක්ෂා කිරීම, සේවාවට අදාළ ගෙවීම් සඳහා අවංක වීම , ප්‍රවාහන සේවා භාවිත කිරීමේදී ආදාරශීලී වීම හා නීතිගරුක වීම , පොදු ප්‍රවාහන භාවිතය නිසා තමන්ටත් රටටත් අත්වන ප්‍ර යෝජන පිළිබඳ දැනුවත් භාවයෙන් කටයුතු කිරීම යන කරුණු වලින් අවම වශයෙන් කරුණු දෙකක්වත් විස්තර කිරීම.

(3). i.රෝගීන්ට ප්‍රතිකාර කිරීම , රෝග වැළැක්වීම හා පාලනය කිරීම සඳහා ක්‍රියා කිරීම , වෛද්‍ය සායන පැවැත්වීම , මාතෘ සායන පැවැත්වීම, රෝග විනිශ්චය සඳහා පර්යේෂණ පැවැත්වීම , හදිසි අනතුරු සේවා ක්‍රියාත්මක කිරීම , සෞඛ්‍ය ප්‍රවාහන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම , පාසල් සිසුන් සඳහා සායන පැවැත්වීම හා දන්ත චිකිත්සාගාර පැවැත්වීම.

ii. බටහිර වෛද්‍ය ක්‍රමය , දේශීය ආයුර්වේද වෛද්‍ය ක්‍රමය , සිද්ධි යුනානි හා හෝමියෝපති

. iii.ජාතික රෝහල්,ශික්ෂණ රෝහල් ,පළාත් මහ රෝහල් ,දිස්ත්‍රික් මහ රෝහල් .මූලික රෝහල් , ප්‍රාදේශීය රෝහල් , විශේෂිත රෝහල් , ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර ආයතන

(4) i. *සාකච්ඡා මගින් නිවැරදි තීරණවලට එළැඹීම , *නායකත්වයට ගරු කිරීම,

*සහයෝගයෙන් කටයුතු සිදුකිරීම,

*අධ්‍යාපනය , භෞතික සම්පත් , පෙළපොත් , නිල ඇඳුම් , ක්‍රීඩා හා වෙනත් පහසුකම් මානව ලැබීම ,

*පාසල තුළ පවතින පොදු නීති රීති , සම්ප්‍රදායන් පිළිගැනීම හා ආරක්ෂා කිරීම,

*සමිති සමාගම්වල තනතුරු ලබාගැනීම, අදහස් ප්‍රකාශ කිරීම, ඡන්දය ලබාදීම

* උපේක්ෂාවෙන් ජය පරාජය භුක්ති විඳීම හා සාමකාමීව ගැටලු නිරාකරණය කරගැනීම

ii. *සාහිත්‍ය , ආගමික , ක්‍රීඩා , විෂයානුබද්ධ සමිති පැවැත්වීම

* ජාතික උත්සව , ආගමික උත්සව , ක්‍රීඩා උත්සව , සංස්කෘතික උත්සව සංවිධානය
* ශිෂ්‍ය නායක , පන්ති නායක , විෂය නායක , ක්‍රීඩා නායක වශයෙන් වගකීම පැවරීම
* නර්තනය , ගායනය , වාදනය , චිත්‍ර ඇඳීම , සාමාන්‍ය දැනීම , රචනා විවාද වැනි තරඟ සංවිධානය කිරීම හා පැවැත්වීම.
* ශිෂ්‍යභට , පරිසර භට , බාලදක්ෂ , ප්‍රථමාධාර සේවා පුහුණුවීම් හා අත්දැකීම් ලබා දීම.
*අධ්‍යාපන චාරිකා , ක්ෂේත්‍ර චාරිකා , විනෝද චාරිකා සංවිධානය කිරීම.

iii.*විවිධ උත්සව කටයුතු සංවිධානය කිරීම * ඉඩමක් /නිවසක් මිළදී ගැනීම

*නිවසක් තැනීම , අළුත්වැඩියා කිරීම, වෙනස් කිරීම *වාහනයක් මිළදී ගැනීම , විවාහ තීරණ කිරීම

(5) i. ඒකාධිපති නායකත්ව ශෛලිය , දූෂිත නායකත්ව ශෛලිය , නාමික නායකත්ව ශෛලිය, ප්‍රජාතන්ත්‍රවාදි නායකත්ව ශෛලිය

ii. මානව හිතවාදී බව , අවංක බව , කැපවීම , සමානාත්මතාව , මිත්‍රශීලී බව නිර්මාණශීලි බව , නිවැරදි තීරණ ගැනීම , ආත්ම විශ්වාසය , සවන් දීම , අන් අයට උදව් කිරීම , දුර දක්නා බව , පක්ෂග්‍රාහී නොවීම, සමාජශීලී බව

iii.ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයක් තුළින් * සමාජය තුළ සුහදතාවය වර්ධනය වීම

*ගැටුම් අවම සමාජයක් බිහිවීම * නීති ගරුක ජන සමාජයක් බිහිවීම

*සියලු දෙනාගේම අයිතිවාසිකම් ආරක්ෂා වීම යන යහපත් ලක්ෂණ වලින් දෙකක්වත් විස්තර කිරීම

6). i. *එකම රටක් තුළ විවිධ වු සංස්කෘතින් පැවතීම බහු සංස්කෘතියයි. විවිධ භාෂා කතාකරන , විවිධ ආගම් අදහන , විවිධ සිරිත් විරිත් අනුගමනය කරන මිනිසුන් සිටින රටවල් හෝ සමාජ බහු සංස්කෘතික ජන සමාජ වේ.

ii. ඇසළ උත්සවය , වෙසක් උත්සවය , පොසොන් උත්සවය

iii. *ජන වර්ගය - දෙමළ , උර්දු , බෙංගාලි , මුස්ලිම් , බන්ජාරා , චක්මා , මරාති , මුණ්ඩා

* භාෂා - හින්දි , උර්දු , දෙමළ , ඉංග්‍රිසි , මරාටි , මලයාලම් , පංජාබි , තෙළිඟු , ගුජරාටි , කණ්ඩා , සංස්කෘත

(7). i. *විනය ගරුක නොවීම * බීමත්ව රිය පැදවීම * වලංගු රියදුරු බලපත්‍ර නොමැතිව රිය පැදවීම

*මාර්ග සංඥා හා පොලිස් නිළධාරින් දෙන අණ නොපිළිපැදීම * අධික වේගයෙන් රිය පැදවීම

*වැඩිපුර මගීන් රැගෙන යාම * ජංගම දුරකතන භාවිත කරමින් රිය පැදවීම * අධික ලෙස වෙහෙසට පත්ව සිටියදී රිය පැදවීම * කාළගුණික තත්ත්වයන් පිළිබඳව අවධානය යොමු නොකිරීම.

ii. * මාර්ග සංඥා , මාර්ග නීති පිළිබඳව සැලකිලිමත් නොවීම *මහමඟ දකුණු පසින් ගමන් නොකිරීම

*කණ්ඩායම් වශයෙන් ගමන් කිරීම * පාර මාරු වීමේදී කහ ඉරි හෝ පදික මාරු භාවිත නොකිරීම

* ජංගම දුරකතන භාවිත කරමින් ගමන් කිරීම * රාත්‍රි කාලයේදී කලු හෝ අඳුරු ඇඳුම් ඇඳ ගමන් කිරීම

iii. *තුවාල ලත් අය රෝහල් වෙත රැගෙන යාම * අනතුර පිළිබඳ හැකි ඉක්මනින් ළඟම ඇති පොලිසිය දැනුවත් කිරීම *ප්‍රචණ්ඩකාරි ක්‍රියා සිදුවීමට ඇති ඉඩකඩ වැළැක්වීමට කටයුතු කිරීම * විපතට පත් වු අයගේ මුදල් භාණ්ඩ ආරක්ෂා කර දී ඒවා ආරක්ෂක අංශ හෝ හිමිකරුවන්ට හෝ භාරකරුවන්ට ලබාදීම යන කරුණු ඇතුලත් විය යුතුය.